# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 ජූලි මස 16 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.07.20 දින නිකුත් කරන ලදී)

## විශ්වවිද්‍යාල (සංශෝධන)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධ්‍යාපන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 17.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට 23අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ විශේෂිත කාර්ය සඳහා විශ්වවිද්‍යාල පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*7 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*8 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*9 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*10 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*11 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*12 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*13 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 145 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*14 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ "පාලක බලමණ්ඩලය", "උසස් අධ්‍යාපන ආයතනය" සහ "ප්‍රධාන විධායක නිලධරයා" යන යෙදුම්වල අර්ථ නිරූපණ ප්‍රතියෝජනය කිරීම වේ.

එල්. ඩී.—ඕ. 8/2021

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2021 අංක      දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1978 අංක 16 දරන පනතට 23අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත, ඒ ප්‍රඥප්තියේ 23 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 23අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"විශේෂිත කාර්ය සඳහා විශ්වවිද්‍යාල පිහිටුවීම

23අ. (1) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාව විමසා (මෙහි මින් මතු ''විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාල නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්-

(අ) 21 වන, 22 වන, 23 වන, 24 වන, 24අ සහ 25 වන වගන්තිවල සඳහන් ආයතන අතුරින් යම් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට, ඒ නියමයෙහි සඳහන් කරනු ලබන සියලුම අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබා දීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) ඒ විශ්වවිද්‍යාලයට නමක් හා අභිධානයක් දිය හැකි ය; සහ

(ඇ) ඒ විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටා තිබිය යුතු ප්‍රදේශය හෝ භූමි භාගය නියම කළ හැකි ය.

(2) ඒ විශ්වවිද්‍යාලයේ සැකැස්ම, බලතල, කාර්ය සහ කර්තව්‍ය නියමාවලි මඟින් නියම කරනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "විවෘත විශ්වවිද්‍යාල නියමයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක්, උසස් අධ්‍යාපන ආයතන නියමයක්" යන වචන වෙනුවට "විවෘත විශ්වවිද්‍යාල නියමයක්, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාල නියමයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක්, උසස් අධ්‍යාපන ආයතන නියමයක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "23 වන, 24 වන" යන වචන හා ඉලක්කම් වෙනුවට "23 වන, 23අ, 24 වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "විවෘත විශ්වවිද්‍යාල නියමයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක් හෝ උසස් අධ්‍යාපන ආයතන නියමයක්" යන වචන වෙනුවට "විවෘත විශ්වවිද්‍යාල නියමයක්, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාල නියමයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක් හෝ උසස් අධ්‍යාපන ආයතන නියමයක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "23 වන, 24 වන" යන වචන හා ඉලක්කම් වෙනුවට "23 වන, 23අ, 24 වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක මූල්‍යාධිකාරීවරයාගේ හෝ භාණ්ඩාගාරිකගේ" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක මූල්‍යාධිකාරීවරයාගේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක භාණ්ඩාගාරිකගේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (අ) ඡේදයේ "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ අතුරු විධානයේ "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" යන වචන යෙදෙන කවර හෝ ස්ථානයක් සඳහා ම "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" සහ "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" යන වචන වෙනුවට පිළිවෙළින් "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක" සහ "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියේ "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" සහ " විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" යන වචන වෙනුවට පිළිවෙළින් "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක" සහ "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තියේ "විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ මූල්‍යාධිකාරීවරයා විසින් නැතහොත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක භාණ්ඩාගාරික" සහ "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන වචන වෙනුවට පිළිවෙළින් " විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක මූල්‍යාධිකාරීවරයා විසින් නැතහොත් විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක භාණ්ඩාගාරික" සහ "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තියේ (6) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "විශ්වවිද්‍යාලයේ හෝ විවෘත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා වෙත හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ලේකම්වරයා" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා වෙත හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ලේකම්වරයා" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ (iii) වන උපඡේදයේ "විශ්වවිද්‍යාලයේ හෝ විවෘත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා වෙත හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ලේකම්වරයා" යන වචන වෙනුවට

"විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා වෙත හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ලේකම්වරයා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තියේ "විශ්වවිද්‍යාලවලට, විවෘත විශ්වවිද්‍යාලවලට හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනවලට" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාලවලට, විවෘත විශ්වවිද්‍යාලයට, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලවලට හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනවලට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තියේ (1) වන උපවගන්තිය "විශ්වවිද්‍යාලයක් හෝ විවෘත විශ්වවිද්‍යාලය, උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලය, උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 145 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 145 වන වගන්තියේ "21 වන, 22 වන, 23 වන හා 24 වන වගන්ති" යන වචන හා ඉලක්කම් වෙනුවට "21 වන, 22 වන, 23 වන, 23අ හා 24 වන වගන්ති" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "පාලක බලමණ්ඩලය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""පාලක බලමණ්ඩලය" යන්නෙන්-

(i) විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ;

(ii) විවෘත විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ;

(iii) විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ; සහ

(iv) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් සම්බන්ධයෙන් වූ විට, එම විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ කළමනාකාර මණ්ඩලය අදහස් වේ;";

(2) "උසස් අධ්‍යාපන ආයතනය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"''උසස් අධ්‍යාපන ආයතනය'' යන්නෙන්, මේ පනත යටතේ පිහිටවනු ලැබූ හෝ පිහිටවනු ලැබූ ලෙස සැලකෙන විශ්වවිද්‍යාලයක්, මණ්ඩපයක්, විවෘත විශ්වවිද්‍යාලයක්, විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් අදහස් වේ;"; සහ

(3) "ප්‍රධාන විධායක නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්-

(i) විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා අදහස් වේ;

(ii) විවෘත විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විවෘත විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා අදහස් වේ;

(iii) විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විශේෂිත කාර්යයක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා අදහස් වේ; සහ

(iv) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා අදහස් වේ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.